## 2021/08/10 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2021/08/10 දින පෙ.ව. 9.30 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 7. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 8. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 10. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 11. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 12. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 13. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 14. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 16. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 17. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 18. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 19. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 20. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 21. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 25. | කේ.එච්.එම්.නදීකා දර්ශනී මිය | ගරු මන්ත්‍රිනී |

**සහභාගී නොවූ**

| | | |
|---|---|---|
| 01. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 02. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

2021.08.10 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු සියළුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. අදත් වෙනදා වගේම රටේ රටේ පවතින කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ සෞඛ්‍ය නීතිරීතිවලට අනුකූලව සභා රැස්වීම පැවැත්වීමට කටයුතු කරනවා. අද පැමිණි උප සභාපතිතුමා ඇතුළුව සියළුම මන්ත්‍රීතුමන්ලා. මන්ත්‍රීතුමියන්ලා, මා ඉතා ගෞරවයෙන් පිළිගන්නවා. ඒවගේම වෙනදා මෙන් සභාව දීර්ඝ වශයෙන් පැවැත්වීමට නොහැකි වුනත්, අවශ්‍ය කරුණු කාරණා සියල්ල අනුමත කර ගැනීම සහ වර්තමානයේ පවතින තත්වය පිළිබඳව සමාලෝචනයක් කරලා, සභාව පවත්වලා සභාව පැත්තෙන් ඉටු විය යුතු කර්තව්‍යයන් පිළිබඳව තමයි සාකච්ඡා කරන්නෙ. විශේෂයෙන් ගරු මන්ත්‍රී බන්දුල හිරිමුතුගොඩ මහතා අද දින සභා රැස්වීමට සහභාගී විය නොහැකි බව දුරකථනයෙන් දැනුම් දුන්නා ඊට හේතුව තමයි. එතුමගේ බිරිඳත්, දියණියටත් කොරෝනා ආසාධනය වීම නිසා එතුම පළමු පෙළ ආශ්‍රිතයෙක් බවට පත් වෙලා. ඒ අනුව අද සභාවාරය පවත්වාගෙන යාමට, සියලුම මන්ත්‍රීවරුන්ගේ සහයෝගය ලබා දෙන මෙන් මම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

-

**(අ)01. 2021.07.13 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

නැත

2021.07.13 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(අ)02. 1. 2021.07.28 දින පැවති විශේෂ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. 2021.07.28 දින පැවති විශේෂ සභා වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

ආදාහනාගාරය ඉදි කිරීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුව මගින් අනුමත කර ඇති කොන්ත්‍රාත් සමාගම් පිළිබඳ යෝජනාව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා, සහ ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත වූ බවට සභා වාර්තාවේ සඳහන් වන නමුත්, එය පහත පරිදි සංශෝධනය විය යුතු බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ප්‍රකාශ කරන ලදී. ඒ අනුව,

ආදාහනාගාරය ඉදි කිරීම සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුව මගින් අනුමත කර ඇති කොන්ත්‍රාත් සමාගම් පිළිබඳ යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා, සහ ගරු මන්ත්‍රී බන්දුල හිරිමුතුගොඩ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත වූ බවට සංශෝධනය කරන ලදී.

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත.

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. පොදු ඉඩම් කොටසක් සම්බන්ධව ටී.වී.සරත් රවීන්ද්‍ර, සමගිගම , උඩුගම විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

02. තල්ගස්වල සති පොළ නැවත පවරා දීම සම්බන්ධව මාලනී බණ්ඩාරිගොඩ, නව නගරය, තල්ගස්වල විසින් 2021.07.27 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**මේ සම්බන්ධයෙන් ටෙන්ඩර් කමිටුවේ නිර්දේශය සාදාරන බවත්, හිඟ බදු මුදල් අය කර ගෙන නිදහස් කොට පොළ නැවත සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට තීරණය විය.**

03. පොළ නොපැවැත්වීම, ව්‍යාපාරිකයන් හා ජනතාව පොළට නොපැමිණීම හේතුවෙන් පොළ බදු මුදලින් සහනයක් ලබා ගැනීම යන මැයෙන් මාලනී බණ්ඩාරිගොඩ, නව නගරය, තල්ගස්වල විසින් 2021.07.27 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

04. ගාල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම, ක්‍රීඩා පාසල් ලෙස හඳුනාගත් පාසල්වල පහසුකම් වැඩි දියුණු කිරීම සහ බහාලුම් මත ස්ථාපිත එළිමහන් කායවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම යන වැඩසටහන් සම්බන්ධ ප්‍රගති සමාලෝචන සාකච්ඡාව - 2021.08.13 යන මැයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල විසින් යොමු කරන ලද 2021.08.05 දිනැති ලිපිය සභාගත කරන ලදී.

**මේ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා විසින්, තම බල ප්‍රදේශයේ පවතින ග්‍රාමීය ක්‍රීඩා පිටි සහ ක්‍රීඩා පාසල් ලෙස හඳුනාගත් පාසල්වල තොරතුරු සභාව වෙත ලබා දෙන මෙන් ගරු මන්ත්‍රීවරුන් හට දන්වන ලදී.**

05. නිදහසට කරුණු දැක්වීම සම්බන්ධව ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා, මුරකරු, නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් 2021.07.20 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

06. වීථි පහන් සවි කිරීම සම්බන්ධව ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා විසින් යොමු කරන ලද 2021.08.09 දිනැති ලිපිය සභාගත කරන ලදී.

07. වාහන සෝදන මෝටරයේ අලුත්වැඩියාව සඳහා අවශ්‍ය කොටස් මිළදී ගැනීම සම්බන්ධව සංවර්ධන නිලධාරී (ආ 06) විසින් යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

08. උඩුගම මහජන පොළ අසළ අසල මාළු වෙළඳාම් කිරීම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම යන මැයෙන් පී.ජී. සමන් කුමාර, බාර් හංදිය, උඩුගම විසින් යොමු කරන ලද 2021.08.10 දිනැති ලිපිය සභාගත කරන ලදී.

09. පොදු කටයුතු සඳහා වෙන් කර ඇති භූමිය සම්බන්ධව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් 2021.08.04 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**(ඈ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

**01**. නාගොඩ ඉහළ 216 ඒ ග්‍රාමසේවා වසමේ අන්නාසිගලහේන කොටසේ ඇති සෞඛ්‍යය මධ්‍යස්ථානයේ සිට ශාන්ත මහතාගේ නිවස අසළ දක්වා මාර්ගය ජේ.සී.බී.යන්ත්‍රය යොදවා සංවර්ධනය කිරීම සහ ගල් බැම්මක් ඉදි කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරනු ලැබුව ඒකමතිකව සභා සම්මත විය.**

**02**. කුරුන්ද කළුගල අසල සිට සුබෝධ මහතාගේ නිවස අසල මාර්ගය ජේ.සී.බී.යන්ත්‍රයක් යොදවා සංවර්ධනයට කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කරනු ලැබුව ඒකමතිකව සභා සම්මත විය.**

**03**. 216 බී කුරුපනාව ග්‍රාමසේවා වසමේ අලවත්ත විලවත්ත අසල සිට කුරුපනාව මරණාධාර සමිතිය අසල දක්වා ඇති බංගලාව පාර පස් දමා ගොඩ කර, සංවර්ධනයට කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලැබුව ඒකමතිකව සභා සම්මත විය.**

**04**. 216 ඒ නාගොඩ ඉහළ ගොඩ අරඹ මාර්ගය මුල් කොටස පස් දමා ගොඩකර සිලින්ඩරයක් දමා ජලය බැස යාමට සකස් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලැබුව ඒකමතිකව සභා සම්මත විය.**

**05.** 216 ඒ නාගොඩ ඉහළ අන්නාසිගලහේන මුලන මාර්ගයේ සිට හිරිමුතුගොඩ කඩය අසල ප්‍රධාන මාර්ගය යාවන පාර අන්නාසිගලහේන මාර්ගයෙන් ගලවා ඉවත් කරන ලද කැටගල් අතුරා සංවර්ධනයට කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරනු ලැබුව ඒකමතිකව සභා සම්මත විය.**

**06**. 216 ඒ නාගොඩ ඉහළ කුරුන්ද ලියන මහතාගේ කඩය ඉදිරිපිටින් ඇරඹී කළුගල අසලින් ප්‍රධාන පාරට යාවන අතුරු මාර්ගයේ මුල් කොටස අන්නාසිගලහේන මාර්ගයෙන් ගලවා ඉවත් කරන ලද කැටගල් අතුරා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරනු ලැබුව ඒකමතිකව සභා සම්මත විය.**

07. වාහන සෝදන මෝටරයේ අලුත්වැඩියාව සඳහා අවශ්‍ය කොටස් මිළදී ගැනීමට යෝජනා කරමි.

වාහන සඳහා කාර්මික දැණුම ඇති කාර්මික ශිල්පියකු බඳවා ගෙන සියළුම කාර්මික අංශවල වැඩ සඳහා යොදවා ගන්නා මෙන් ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා ප්‍රකාශ කරන ලදී.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

08. කැප්පිටියාගොඩ පඹේදෙණිය කුඹුර දක්වා වූ මාර්ගය සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා දිසානායක මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

09. තල්ගස්වල සති පොළ නැවත සභාවට පවරා ගැනීමට යෝජනා කරමි

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**09. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 45 දක්වා ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.**

2021.08.10 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.

**01.ලංකා විදුලිබල මණ්ඩලය**
**2021 ජූලි මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු. 7620.55 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 240.00 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු. 734.10 |
| 4501090200 | - මාපලගම වෙලද සංකීර්ණ කොරිඩෝව | - රු. 477.90 |
| 8616373802 | - උඩුගම පොළ හෝමදොල | - රු. 240.00 |
| 8616374000 | - උඩුගම ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු. 258.30 |
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 569.40 |
| 8617046104 | - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය | - රු. 770.70 |
| 4509082908 | - උක්ඕවිට පෙර පාසල | - රු. 240.00 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු.1941.90 |

**2021 ජූනි මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු.1466.10 |

**2021 අප්‍රේල් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 2813189405 | - තල්ගස්වල පෙර පාසල | - රු. 258.30 |

**02. 2021 ජූනි මස දුරකථන බිල්පත්**

**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

| | | | |
|---|---|---|---|
| i. | 0912231201 | - සභාපතිතුමාගේ නිවස | - රු. 3314.06 |
| ii. | 0912296577 | - මාපලගම උප කාර්යාලය | - රු. 422.98 |
| iii. | 0912296537 | - සභාපතිතුමාගේ නිල කාමරය | - රු. 4370.62 |
| iv. | 0912296433 | - ප්‍රධාන කාර්යාලය | - රු. 5929.30 |

**03.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය**

33/53/003/009/10 - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය
(2021.06.21 – 2021.07.21) - රු. 3375.54

33/53/003/008/11 - උඩුගම උප කාර්යාලය
(2021.06.21 – 2021.07.21) - රු. 672.84

**04.ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, බද්දේගම**

i. පානීය ජල අවශ්‍යතාවයන් සඳහා ණය පදනම මත ජලය ලබා ගැනීමට අදාළ ගාස්තු (උඩුගම රෝහල සඳහා)
2021 ජූලි - රු. 3780.00

**<u>05 .2021 ජූලි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.එල්.එන්.ප්‍රමෝද මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| අනුෂා සමරවික්‍රම මෙය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 3000.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**<u>06.2021 ජූලි මස ගමන් වියදම්</u>**

**<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - සභාපති | - රු. 3000.00 |
| කේ.ඩී.එස්. නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | - රු. 510.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 3500.00 |

**<u>07. අතිකාල දීමනා ගෙවීම්</u>**

**<u>2021 ජූලි මස</u>**

| | | |
|---|---|---|
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9136.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 7403.00 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 8312.50 |
| එන්.එම්.රජිත මයා | - අනියම් මුරකරු | - රු. 4343.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8560.00 |
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු. 6947.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 8239.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 1256.00 |
| හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 3134.00 |
| එස්.ඩී.එම්.කැටිපෙආරච්චි මයා | - විදුලි කාර්මික | - රු. 2205.00 |
| කේ.එම්.එම්.නිශාන්ත ඉඳුනිල් මයා | - රියදුරු | - රු. 7918.00 |

**2021 ජුනි මස**

එස්.ඩී.එම්.කැටිපෙආරච්චි මයා - විදුලි කාර්මික - රු. 1653.00

**08. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. 2021 ජූලි මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත - රු.81000.00

ii. LL 7103 ටිපර් රථයේ ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා ගත් අත්තිකාරම පියවීම - රු.15400.00

iii. SPRA 8569, SPRA 8570, LL 7366, SPRA 2239 ට්‍රැක්ටර් හා LL 7650 කෘ කැබ් රථය රක්ෂණ සහතික ලබා ගැනීම සඳහා ගත් අත්තිකාරම් මුදලින් ඉතිරි මුදල් පියවීම - රු. 4700.00

iv. සභාව සතු වාහන සහ ජල බවුසර් සඳහා ලබා ගත් අත්තිකාරම පියවීම - රු. 19000.00

v. සභාපතිතුමාගේ රාජකාරි අවශ්‍යතාවයන් සඳහා කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් බිල්පත් මුදල් ගෙවීම් - රු. 3600.00

**09. එම්.ජී.ඩිලානි චන්ද්‍රප්‍රභා මිය,**

රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක sp/psc/07/01/08(76) හා 2021.05.17 දිනැති ලිපිය අනුව ලේකම් තනතුරෙහි වැඩ බැලීම වෙනුවෙන් දීමනා ගෙවීම - 2021 ජූලි - රු. 10395.00

**10. එච්.එල්.කේ.ශ්‍රිනිත් රුක්ෂාන් මයා, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2021 ජූලි - රු. 4590.00

**11. ජී.ඩී. කරුණාරත්න මයා, සරත් ස්ටෝර්ස්, යටලමත්ත**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2021 ජූලි - රු. 5460.00

**12. නිව් විජය මෝටර්ස්, ගාල්ල**

PF 7360 කැබ් රථය සඳහා බැට්‍රිය ලබා ගැනීමේ බිල්පත - රු.13500.00

LL 7103 ටිපර් රථය සඳහා ටියුබ් 3 ක් රිම් ටේප් 3 ක් ලබා ගැනීම වෙනුවෙන් බිල්පත - රු.14100.00

**13. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා අගෝස්තු මස මාසික කුලිය ගෙවීම - රු.5000.00

**14. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**

i. උඩුගම සති පොළ කඩකාමර ඉදිකිරීම 2 අදියර යටතේ මිළදී ගත් සිමෙන්ති සඳහා මුදල් ගෙවීම - රු. 9500.00

**15. ජී.පී.සඳුන් චතුරංග මයා, මාපලගම**

i. තාක්ෂණික අංශයේ පරිගණක යන්ත්‍රය සඳහා ඔටෝ කැඩ් මෘදුකාංගය ඇතුලත් කිරීමේ බිල්පත - රු. 500.00

ii. ආදායම් අංශයෙහි ඇති පරිගණක යන්ත්‍රයේ මව් පුවරුව අක්‍රීය වීම නිසා එය අලුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 4150.00

iii. Pay roll මෘදුකාංගය ක්‍රියාත්මක වන පරිගණක යන්ත්‍රයේ මව් පුවරුව හා ප්‍රොසෙසරය හා අදාළ කොටස් මිළදී ගැනීමේ බිල්පත - රු. 8000.00

iv. ගරු සභාපතිතුමාගේ නිල කාමරයේ ඇති පරිගණක යන්ත්‍රය සඳහා අවශ්‍ය වෙබ් කැමරාවක් මිළදී ගැනීමේ බිල්පත - රු. 2500.00

**16. ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් ප්‍රයිවට් ලිමිටඩ්, කොළඹ 02**

ටොෂිබා ඡායා පිටපත් යන්ත්‍රය සඳහා අවශ්‍ය ටෝනර් කාට්ලේජ 02 ක් මිළදී ගැනීමේ බිල්පත - රු. 25963.20

**17. ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාව, මාතර**
සෞඛ්‍ය කම්කරුවන් සඳහා අවශ්‍ය ගම් බූට් හා රබර් ග්ලවුස් මිළදී ගැනීමේ බිල්පත - රු.10840.00

**18. දිල්ෂාන් ලක්ෂිත වික්‍රමසේකර, ඉරේෂා ගාමන්ට්, යටලමත්ත**
කම්කරුවන් සඳහා අවශ්‍ය වැහි කබා ලබාගැනීමේ බිල්පත - රු.21000.00

**19. ආසිරි ඔටෝ සර්විස්, ගාල්ල**
RA 8570 ට්‍රැක්ටරය සේවා කිරීමේ බිල්පත - රු.29007.00

**20. එදිරිසිංහ මෝටර්ස්, උඩුගම**
LL 7650 අංක දරණ කෘ කැබ් රථයේ අළුත්වැඩියා කිරීමේ වියදම් - රු. 2225.00

**21. කේ.එම්.ටී.ඩිස්ට්‍රිබියුටර්ස්, ගාල්ල**
වීථි පහන් අළුත්වැඩියාව සඳහා අවශ්‍ය උපාංග මිළදී ගැනීමේ බිල්පත - රු.187400.00

**22. විගණකාධිපති, විගණන කාර්යාලය**
i. හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10823.00

**23. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම
(2021 ජූලි) - රු.14500.00

**24.නීතීඥ හේමන්ත පී.ඩබ්.විතාරණ මයා, ගාල්ල**
i. 2021.07.09 දින කැඳවූ එස් පී 138 දරණ බද්දේගම දිසා අධිකරණයේ පැවති නඩුවට අදාළව නීතීඥ හා පෙනී සිටීමේ, ( ආරච්චිදිගන ඇළ මාර්ගයේ නඩුව) - රු. 5000.00
ii. 2021.07.20 දින කැඳවූ එල් 13814 දරණ ගාල්ල දිසා අධිකරණයේ පැවති නඩුවට අදාළව නීතීඥ හා පෙනී සිටීමේ, (ගල්වාන පිංවත්ත පාර) - රු. 3000.00

**25. සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, කොළඹ 10**
හලන යන්ත්‍රය මිළ ගණන් කැඳවීම සඳහා අදාළ දැන්වීම් පළ කිරීමේ බිල්පත් ගෙවීම - රු. 7803.00

**26. අරුණ ඉලෙක්ට්‍රිකල්ස්, යක්කලමුල්ල, ගාල්ල**
වීථි පහන් අළුත්වැඩියාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීමේ බිල්පත -රු. 6400.00

**27. ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**
i. 2021 ජූලි මස විශේෂ සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 378.00
ii. 2021 ජූලි මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 1050.00

**28. ඒ.ජේ.සී.ස්ටේෂනර්ස්, ගාල්ල**
ලිපිද්‍රව්‍ය මිළදී ගැනීමේ බිල්පත පියවීම - රු. 28220.00
ලිපිද්‍රව්‍ය මිළදී ගැනීමේ බිල්පත පියවීම - රු. 25195.00

**29. ජයන්ත ඔෆ්සෙට් ප්‍රින්ටර්ස්, බෙලිගහ**
1987 අංක 15 පනතේ 150/152 වගන්ති යටතේ බදු අය කිරීමේ පත්‍රිකා
මුද්‍රණය කිරීමේ බිල්පත - රු. 1250.00

**30.** **අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**
PF 7360 කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු.22785.00

**31.** **ප්‍රාදේශීය ලේකම්, නාගොඩ**
2021.07.01 නාගොඩ රාජකීය ජාතික පාසලේ සහ 2021.07.02 දින නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති කොවිඩ් එන්නත්කරණ වැඩසටහනට සම්බන්ධ වූ සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට හා නිලධාරීන් වෙත ලබා දුන් සංග්‍රහවලට අදාළ බිල්පත් ගෙවීම - රු. 23050.00

**32.** **සඳරු ග්‍රොසරි ඇන්ඩ් ග්‍රයින්ඩින් මිල්ස්, නාගොඩ**
i. ප්‍රාදේශීය සභාවේ 2021.07.13 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත - රු. 3982.00
ii. ප්‍රාදේශීය සභාවේ 2021.07.28 වන දින පැවැත්වූ විශේෂ සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත - රු. 2335.00

**33.** **අයි.පී.එන්.ජී. විකුම් සුරංග මයා, උඩුගම**
උඩුගම පොළ භූමියේ ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත - රු. 80700.00

**34.** **චතුර ට්‍රේඩ් සෙන්ටර්, උඩුගම**
ඇප්තොප්වත්ත කොම්පෝස්ට් අංගනය සඳහා ඔරලෝසුවක් මිළදී ගැනීමේ බිල්පත - රු. 700.00

**35.** **මහගෙදර හාඩ්වෙයාර්, මාපලගම**
ආයුර්වේද මධ්‍යස්ථානයේ ඖෂධ පැකට් කර ගබඩා කිරීම සඳහා අවශ්‍ය කන්ටේනර් ලබා ගැනීමේ බිල්පත පියවීම - රු. 1830.00

**36.** **විජේතුංග ගෘප් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ් , ගාල්ල**
ටයර් ඩැග් කිරීමේ බිල්පත ගෙවීම - රු. 50135.00

**37.** දිනිත් ශදීර පණ්ඩිත, රුහුණු කමල් හොටෙල්, සුරනිමල, ගා/ ඇතුමලේ
Covid-19 එන්නත්කරණ වැඩසටහන සඳහා සෞඛ්‍ය කාර්ය මණ්ඩලයට ලබා දුන් සංග්‍රහ වියදම් වෙනුවෙන් මුදල් ගෙවීම( 2021/07/24, 2021/07/26, 2021/07/27, 2021/07/29, 2021/07/30, 2021/07/31, 2021/08/02) -රු.127300.00

**පොදු අරමුදල්**

**38.** **සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**
උඩුගම සති පොළ නව කඩ කාමර ඉදි කිරීම ( අදියර) ඍජු ශ්‍රමික කර්මාන්තයේ ජූලි, අගෝස්තු මාසවල සේවයේ නිරත වූ කම්කරුවන් සඳහා කුලීය ගෙවීම -රු.129400.00

**39.** **පී.වානක රංග, වානක එන්ටර්ප්‍රයිසස්, කහඳුව**
ආදාහනාගාරය ඉදිකිරීමට යෝජිත භූමිය සකස් කිරීම සඳහා ජේ.සී.බී. යන්ත්‍රය යොදා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු.147500.00

**40.** **සී/ස බද්දේගම (බටහිර) ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර සමිතිය, පුහුල්දූව**
මාර්ග සංවර්ධනය සඳහා සිලිංඩර් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 80150.00

**41.** **ටී.එච්. චාමර සම්පත් මයා, චාමර කන්ස්ට්‍රක්ෂන්, උක්ඕවිට**

ඇප්තොප්වත්ත PC 30 එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම
වෙනුවෙන් මුදල් ගෙවීම - රු.152230.00

**42.** **අසංක කෝන්ගහගේ, උඩවැලිවිටිතලාව**
ආදාහනාගාරය ඉදිකිරීමට යෝජිත භූමියෙහි පස් ඉවත් කිරීම වෙනුවෙන් යෙද වූ ටිපර් රථය සඳහා ගෙවීම් සිදු කිරීම - රු. 67500.00

**43.** **ඒ. එම්.ඩී. පතිනායක මයා, අශේන් කන්ස්ට්‍රක්ෂන්, යටලමත්ත**
කැප්පිටියාගොඩ දකුණ ග්‍රාම සේවා වසමේ නාගොඩවත්ත ප්‍රධාන මාර්ගයේ ගණදෙවිකෝවිල ලග මාර්ගය සංවර්ධනය කිරීමට ජේ.සී.බී. යන්ත්‍රය යෙදවීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 91250.00

**44.** **එම්.වී. නාමල් ලක්රුවන්, නාමල් කන්ස්ට්‍රක්ෂන්, උඩුගම**
ඇප්තොප්වත්ත කොම්පෝස්ට් අංගනයේ නොදිරන කසල බැහැර කිරීමට වලක් හැරීම සහ භූමිය පිරිසිදු කර ගැනීම වෙනුවෙන් බැකෝ යන්ත්‍රය සඳහා මුදල් ගෙවීම - රු. 20500.00

**45.** **කේ.එච්.එන්.දිල්ෂාන් මයා, නිව් මොඩර්න් කර්ටන්ස්,**
නාගොඩ ප්‍රාදේශීය සභාවේ උඩුගම ශ්‍රවනාගාරයේ වේදිකා තිරය සකස් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු.176500.00

**ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී එන්.වී.පතිනායක මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. තල්ගස්වල නව නගරයේ බෞද්ධ මධ්‍යස්ථානයට ඉදිරිපසින් පිවිසුම සහිත කොන්ක්‍රීට්කර ඇති මාර්ගයේ ඉවුරු කඩාගෙන යාමත් එම මාර්ගය ගිලා බැසීමට මත්තෙන් සුදුසු පියවර ගන්නා ලෙස යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කල ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී නදිකා දර්ශනී මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

02. නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත්කර ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මගින් ද නිරීක්ෂණය කර පැති බැම්මක් දැමීමට සුදුසු බව යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ඉදිරිපත් කල ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී නදිකා දර්ශනී මහත්මිය විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**

01. යටලමත්ත බටහිර දළුක්ගල්දෙණිය පාර ප්‍රියන්ත සෙනවිරත්න මහතාගේ නිවස දක්වා ජේ.සී.බී. යන්ත්‍ර යොදා අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ඉදිරිපත් කල ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එන්.ඩබ්.පතිනායක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

02. යටලමත්ත බටහිර BD 5පන්සල අතුරු පාර ජේ.සී.බී. යන්ත්‍ර යොදා අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ඉදිරිපත් කල ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී එන්.ඩබ්.පතිනායක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

03. යටලමත්ත නැගෙනහිර මයියොක්කාහේන පාර ප්‍රදීප් කුමාර මහතාගේ නිවස දක්වා ජේ.සී.බී. යන්ත්‍ර යොදා අළුත්වැඩියා කිරීමට යෝජනා කරමි.
**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ඉදිරිපත් කල ඉහත සදහන් යෝජනාව ගරු මන්ත්‍රී එන්.ඩබ්.පතිනායක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

01. ඇප්තොප්වත්ත pc 30ස්කවේටර් යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු.97500.00
02. යෝජිත වළකුඹුර ආදාහනාගාරයේ පිවිසුම් මාර්ගය හා භූමිය සකස් කිරීම - රු. 500000.00
03. 212 බී කැප්පිටියාගොඩ දකුණ ග්‍රාම සේවා වසමට අයත් නාගොඩවත්ත ප්‍රධාන මාර්ගයේ ගණදෙවි කෝවිල අසල සිට මාර්ගය සංවර්ධනය - රු. 11450.00
04. ගොරොක්ගස්තුඩුව කළුවැල්දෙනිය මාර්ගය බෝක්කු 0 ක් යෙදීම - රු. 15637.50
05. නෙලුවැල් මූකලාන මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 25000.00
06. හෝමදොල පාසල අසල මාර්ගය සුජාතා මහත්මියගේ නිවස දක්වා ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 30000.00
07. හෝමදොල ප්‍රධාන පාරේ සිට අක්.80 පාර නො.02 ප්‍රජා ශාලාව දක්වා ජේ.සී.බී. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම - රු. 50000.00

**ඉහත සදහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**නාගොඩ ප්‍රාදේශීය සභාව**
**වීථි පහන් උපකරණ සදහා මිල ගණන් කැඳවීම - 2021.සාරාංශය**

| | විස්තරය | ප්‍රභාත් ඉලෙක්ට්‍රොනික් -තල්ගම්පල | ඒසියන් එන්ටප්‍රයිසස් -ගාල්ල | කේ.එම්.ටී. ඩිසුට්‍රිබියුටර්ස් - යක්කලමුල්ල | අරුණ ඉලෙක්ට්‍රිකල්ස් - යක්කලමුල්ල |
|---|---|---|---|---|---|
| 1. | **වීදි ලාම්පු** කට්ටල(හිස,ජී අයි පිප්පය,හෝල්ඩරය,ඇනය සහිත තනි බ්‍රැකට්) (metal clad) | 2100.00 | 2250.00 | 1950.00 | ඒසීඑල් - 1050.00 |
| 2. | **කනෙක්ටර් බාර්** (10Amp – 400 V) යුගල 06 | 140.00 | 125.00 | 100.00 | 80.00 |
| 3. | **ටු පින් හෝල්ඩර්** | ඔරේන්ජ් - 125.00 | ඔරේන්ජ් - 130.00 | ඔරේන්ජ්/කෙවිල්ටන් - 120.00 | 85.00 |
| 4. | **පී. වී. සී. 1/1.13 වයර් SLS 733 (කොයිල් 01)** | ඔරේන්ජ් /එස් ආර් සන්ස් 3450.00 | එස් .ආර් සන්ස්- 3400.00 | ඔරේන්ජ් / එස් .ආර් සන්ස්- 3375.00 | 3200.00 |
| 5. | **ඒරියල් බන්ඩල් කනෙක්ටර්ස්** (T-Off Connectors) | 285.00 | 270.00 | 260.00 | 195.00 |
| 6. | **ටම්බලර් ස්විච්** 10A (Tumbler switch) SLS 1000 | වයර්මන් 185.00 | වයර්මන් 185.00 | වයර්මන් / කෙවිල්ටන් - 180.00 | 160.00 |
| 7. | **පී. වී. සී. ඉලෙක්ට්‍රිකල් ඉන්සියුලේෂන් ටේප් රෝල්** (SLS **ප්‍රමිතිය)**1.90cmx9.14mx0.125mm | ඔරේන්ජ් - 75.00 | ඔරේන්ජ් - 75.00 | ඔරේන්ජ් - 70.00 | 70.00 |
| 8. | 12W -12.5 W LED B22 බල්බ -(1200-1250 lumens) Day Light /Warm White වගකීම් කාල සීමාව අවම වසර 2 ක් විය යුතුය. | ඔරේන්ජ් - 820.00 | ඔරේන්ජ් - 800.00 | ඔරේන්ජ් - 780.00 | පොලික්‍රෝම් - 590.00 |
| 9. | 20W LED B22බල්බ - (Warm White)(1900- -2000 lumens) වගකීම් කාල සීමාව අවම වසර 2ක් විය යුතුය.*IP 65 | ඔරේන්ජ් - 1425.00 | ඔරේන්ජ් - 1450.00 | ඔරේන්ජ් - 1400.00 | ඩිමෝ - 975.00 |
| 10. | 40W LED B22 බල්බ - (Day light/Warm white)(1900- -2000 lumens)අවම ලූමන 4000 ක් සහ වසර 02ක අවම වගකීම් කාලයක් සහිත විය යුතුය.*IP 65 | ඔරේන්ජ් - 2050.00 | ඔරේන්ජ් - 2025.00 | ඔරේන්ජ් - 2000.00 | ඩිමෝ- 1550.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ වීථි පහන් උපකරණ වෙනුවෙන් ලැබී තිබූ මිළ ගණන් අනුව ඒ සදහා **තාක්ෂණ නිලධාරී නිර්දේශය ලබා ගෙන අදාල මිළදී ගැනීම් සිදු කිරීම** සුදුසු බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**ප්‍රාදේශීය සභා මහජන නියෝජිතයින් නිලධාරීන් සේවකයන්ගේ රාජකාරි හැදුනුම්පත් සකස් කිරීම සදහා ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය | ලක්මාල් ස්ටුඩියෝ, ගිංතොට , ගාල්ල | සන්සේයා ස්ටුඩියෝ, නාගොඩ | යූ.කේ.වීඩියෝ, යටලමත්ත |
|---|---|---|---|
| පී.වී.සී. මුද්‍රණය, ටැග් එක සහ කරපටිය සහිතව | 675.00 | 600.00 | 650.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභා මහජන නියෝජිතයින්, නිලධාරීන්, සේවකයන්ගේ රාජකාරි හැදුනුම්පත් සකස් කිරීම වෙනුවෙන් ලැබී තිබූ මිළ ගණන් අනුව ඒ සදහා හොදම මිළ ගණන් ඉදිරිපත් කල සන්සේයා ස්ටුඩියෝ, නාගොඩ වෙතින් ප්‍රාදේශීය සභා මහජන නියෝජිතයින් නිලධාරීන් සේවකයන්ගේ රාජකාරි හැදුනුම්පත් සකස් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**සභාවට අයත් කොම්පෝස්ට් අංගනය සදහා හලන යන්ත්‍රයක් මිළදී ගැනීම සදහා ලැබී ඇති මිළ ගණන්**

| විස්තරය | **SAC Enginering Solution, kirimatiyana** | **PCL Solution,pvt ltd" Peeliyagoda** | **MSN Engineering Pvt Ltd, Mahara** |
|---|---|---|---|
| හලන යන්ත්‍රයක් මිළදී ගැනීම | 985000.00 | 569094.23 | 972000.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් කොම්පෝස්ට් අංගනය සදහා හලන යන්ත්‍රයක් මිළදී ගැනීම සදහා ලැබී තිබූ මිළ ගණන් අනුව ඒ සදහා අවම මිළ ගණන් ඉදිරිපත් කල MSN Engineering Pvt Ltd, Mahara වෙතින් එම යන්ත්‍රය මිළ දී ගැනීමට තාක්ෂණ කමිටුව නිර්දේශ කල අතර, එහි ඉදිරි කටයුතු සිදු කිරීමට තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා**

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2021 ජුලි මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් වාර්තාව 2021 අගෝස්තු මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

- 2021 ජූලි මාසයට අදාළ මාසික ඒකාබද්ධ වැය සාරාංශය 2021 අගෝස්තු මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2021 ජූලි මාසයට අදාළ මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය 2021 අගෝස්තු මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**වෙනත් කරුණු**

**ගරු මන්ත්‍රිනී චන්දිමා දිල්රුක්ෂි මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුන්ගෙන් මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. පළමුවෙන්ම මම මේ අවස්ථාවේ මාගේ නිවසේ පැමිණි උත්සවයට සහභාගී වූ සියළුම දෙනාට ස්තූතිය ප්‍රකාශ කරන්න අවස්ථාව කර ගන්නවා. ඒ වගේම එම මාර්ගයේ තාවකාලිකව යොදා තිබූ වීථි පහන් වලින් 2ක් හෝ 3 ක් ස්ථිර වශයෙන් ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම කොරෝනා වසංගතය ගැන කතා කරනවනම්, තල්ගස්වල ප්‍රදේශයේ මේ මොහොත වන විටත් කොරෝනා ව්‍යසනය නිසා එක් පුද්ගලයකු මිය ගොස් ඇති බව දැනගන්න ලැබුණා. ඒ සම්බන්ධයෙන් මම මේ අවස්ථාවේ මාගේ කණගාටුව ප්‍රකාශ කරනවා. මේ එන්නත්කරණ වැඩසටහන වේලාසන එම ප්‍රදේශයට ලැබුණානම්, මේ මරණය පවා වළක්වා ගන්න හැකියාව තිබුණා.
ගරු සභාපතිතුමනි, ඒ වගේම තමයි තල්ගස්වල පොළ ඇතුලෙ වීථි පහන් 03 ක් තියෙනවා. ඒ එක වීථි ලාම්පුවක්වත් පත්තු වෙන්නෙ නැහැ. ඒ වගේම කැන්ටින් එකේ එක දොරක් ගලවගෙන ගිහිල්ලා, අනෙක් පැත්තෙ බාත්රූම් එකේ එක දොරක් ගලවගෙන ගිහිල්ලා සියළුම ටැප් ලයින් කඩාදාලා, වතුර මෝටරය දැම්මට පස්සෙ සියළුම වතුර අහක යනවා. ඒ වගේම සභාපතිතුමනි, විදුලිය ගැන කතා කරනවානම්, ෆියුස් බෝඩ් එකේ සිට සියළුම උපාංග ගැලවිලා තියෙන්නෙ දන්නෙ නැතිව අතක් හරි තිබ්බොත් සියළු දෙනාට මාරාන්තික තත්වයක් ඇතිවෙන්න පුළුවන්. ඒ වගේම තමයි සභාපතිතුමා මේ පොල සකස් කරලා තවම අවුරුදු 3 ක් වගේ කෙටිකාලයක් වෙන්නෙ. නමුත් බිත්ති පුපුරලා කඩන් වැටෙන්නත් ලඟයි. වෙලදාම් කරන්න කියලා කිව්වට වෙලද මහත්වරු බයයි. ඔබතුමන්ලා ගිය වෙලාවක බලන්න හුළඟට පවා සෙලවෙන තත්වයක තියෙන්නෙ. ඒ ටික නිරීක්ෂණය කර, ඒ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගන්න.ඒ වගේම සභාපතිතුමනි, බෝක්කු දාන්න සිළිඩර් ගේන්නෙ බද්දේගමින් නේද? ඒ බෝක්කුවල එක පැත්තක අඟලයි තියෙන්නෙ. අනෙක් පැත්තෙ අඟල් 02 යි වටරවුමෙ තියෙන්නෙ. ගිය සභාවාරෙට කලින් සභාවාරෙට එනවිට බෝක්කු 2,3 ක් පටවන් ආපහු අරන් යනවා. මම දැක්කා. මොකද බෝක්කු පුපුරලා, ඉරි ගිහිල්ලා, කම්බි පේන නිසා නිරීක්ෂණය කරලා, කරනවනම් ඔය තත්වය උදාවෙන්නෙ නැහැ. ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, ඔය බෝක්කු දානකොට අපේ තාක්ෂණික නිලධාරි මහත්මයා යවලා නිසි වැඩ පිළිවෙළක් ඇතිව කටයුතු කරන්න. ඇත්තටම කණගාටුයි. අපේ ගමට වාහනයක් යන විට, බම්ප් වෙනකොට වාහනය යට වදිනවා. අපෙන් අහනවා මෙහෙම ද බොක්කු දාලා තියෙන්නෙ කියලා. ඒවා නිරීක්ෂණය කරන්න. තව දේවල් කතා කරන්න තිබුනත්, මේ කොරෝනා වසංගතය නිසා එළැඹි තත්ත්වය බරපතළයි. ඒ වගේම සභාපතිතුමනි, කොරෝනා වසංගතය හැදිල ගෙන ගියාට පස්සේ, ගෙවල් වල තමයි නිරෝධායනය වෙන්නේ. ඒ මිනිස්සුන්ට දින නමය දහය වන විට කන්න බොන්න නැහැ. බඩුමලු ලැබිලා නැහැ. කැටගොඩ වඩු ගෙදර කියලා ගෙදරක් තියෙනවා. තවම

බඩුමලු ලැබිලා නැහැ. දින දාහතරක් ගිහිල්ලත් තවම බඩු මලු ලැබිලා නැහැ. ඒ ගැනත් සොයා බලන්න කියා ඉල්ලා සිටිමින්, සියලු දෙනාටම ස්තූතිවන්ත වෙමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය, කාර්ය මණ්ඩලයේ සියලුම දෙනාගෙන් අවසරයි. බොහෝ කාලයකට පස්සේ මේ සභාවෙ කතා කිරීමට අවස්ථාවක් ලැබුණා. අද දින වනවිට අපේ පළාත දැඩි ව්‍යසනයකට ලක්වෙච්ච මොහොතක්. ඔබතුමාට මතක ඇති. සභා වාර තුන හතරකට උඩදී, මම සඳහන් කලා. වත්මන් ආණ්ඩුව ගැන කියනවා නෙමෙයි නමුත් ලක්වාසී ජනතාවගේත්, අපේ ප්‍රදේශයේ ජනතාවගේත් අද මේ ආණ්ඩුව බලයට පත් කරන්න හැටනම ලක්ෂයක් ඡන්දෙ දීපු ලක්වාසී ජනතාව සූරාකෑමට ලක්කරලා තමයි තියෙන්නෙ. උගත්, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ හිටපු ජනරාල් ශවේන්ද්‍ර සිල්වා, අනිල් ජාසිංහ වැනි උගත් බුද්ධිමත් පිරිස දේශපාලන ඕනෑ එපාකම් සපුරා ගන්න ඕන නිසා අයින් කරලා, ආණ්ඩුවට ඕන අය දාගත්තා. කොවිඩ් ආරම්භක මොහොතේ මේ අය තමයි ප්‍රධානත්වය දැරුවේ. උදේ ඉඳන් බෙහෙත් විද ගන්න පෝලිම්වල ඉන්නවා. නමුත් බෙහෙත් එක ඇවිල්ල නැහැ. ඒවගේම මාපලගම නගරයම වහලා. මේවා මුලින් යම් පාලනයකට ලක් කරන්න තිබුණ අවස්ථාවක, මේවා මගහැරලා, දරුණු ප්‍රතිඵලයකට මුහුණ දෙන්න වෙලා තියෙනවා. ඩෙල්ටා ප්‍රභේදය ඉතා ශීඝ්‍ර ලෙස සංසරණය වෙමින් පවතිනවා. මේ දරුණු වසංගතය මර්ධනය කිරීම සඳහා අප ප්‍රදේශයේ සභාවක් ලෙස අප මීට වඩා තීන්දු තීරණ ගන්න ඕන. විෂබීජහරණය පවා අද සීග්‍ර ලෙස අඩුවෙලා. ඔබතුමා යම් වැඩපිළිවෙළක් කරන්න ඕන. නන්දන මන්ත්‍රීතුමා කියනවා නිරෝධානයට අම්පාරේ ගෙනිහිල්ලා, නිරෝධායනය ඉවර කරලා, නැවත එන්න ක්‍රමයක් නැතිව අන්ත අසරණ වෙලා තියෙනවා. කොරෝනා රෝගය අත ඇරලා දාපු බවක් තමයි පේන්න තියෙන්නේ. අප ප්‍රදේශයේ කොරෝනා වසංගතය නිසා මොනවා වෙයිද කියලා හිතාගන්න බැහැ. එවන් යුගයක තමයි අපි බලාගෙන ඉන්නේ. ඔබතුමන්ලා පසුගිය දවස්වල නොයෙකුත් පාරවල් වල වැඩ පටන් ගත්තා. ඒවා ඉබ්ගමනින් තමයි යන්නේ. ඒ කාලේ කිව්වා ක්ෂණික ව මුදල් ලැබිලා තියෙන්නේ. මාර්ග විනාශ කරලා දැන් පයින්වත් යන්න බෑ. සභාව යම් තත්වයකට පහළ වැටිලා කියලා දන්නවා. ඒ වුණත් අවශ්‍ය කටයුතු සිදුකිරීමට අවශ්‍ය බව මතක් කරමින්, කොරෝනා වසංගතයට ලක්වී තිබෙන ස්ථානවල විෂබීජහරණය කරන්න කියලා ඉල්ලා සිටිමින්, සියලු ලක්වාසීන් සුවපත් වේවායි පතමින්, මා නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මේ අවස්ථාවේ දීර්ඝ වශයෙන් කතා කළ යුතු වුණත් මම කතාව කෙටි කරනවා. අපේ බල ප්‍රදේශයේ පහුගිය දිනෙක නිරෝධානය කළ ගෙදරට බඩු ලැබුණද දන්නෙ නැහැ. තවත් ගෙදරක ජීවිතයක් කොරෝනා වසංගතය නිසා බිලි ගත්තා. වෙනත් අසනීපයකට රෝහල් ගත කරද්දි කොරෝනා වෛරසය ගොදුරු වී ඒ අහිංසක ජීවිතයක් නැති වුණා. අහිංසක පවුලක්, අහිංසක දෙපළක්, මේ අවස්ථාවේ මම කනගාටුව ප්‍රකාශ කරනවා. රජයේ නොසැලකිල්ල නිසා, දින කිහිපයක් ගෙදර හිටියත් අවශ්‍ය කරුණු කාරණා සැපයුවේ නැහැ. පතිනායක මන්ත්‍රීතුමාගේ ඇහුවා. උයාගෙන පිහාගෙන තනියම කනවා. නමුත් අසල්වැසියෝ උදව් කරන්න බයයි. නමුත් අසල්වැසියන්ගේ හොඳකම නිසා සැලකිල්ලක් ලැබිලා තියෙනවා. නිලධාරීන්ගේ අඩුපාඩු නිසා බඩු මල්ල ලැබිලා නැහැ. ඒත් එක ජීවිතයක් නැතිවෙලා. අනෙක් ජීවිත ජීවත් කරන්න වෙලාවට බඩු මල්ල ලැබුණානම් උයා පිහාගෙන කන්න තිබුණා. අපේ ප්‍රදේශයේ 80% ක් මේ වෛරසය ගිලගෙන හමාරයි. සමහරු ලැජ්ජයි. බයයි. මෙම රෝගය වැළඳුණා කියන්නේ මොකද සමාජයෙන් කොන් කරනවා. එවැනි රෝගයක් මෙම රෝගය. අද මාපලගම වහලා කියන මම මේ ප්‍රදේශයට ආවම තමයි දන්නේ. රටම වහනවා කිව්වත් ඒක පුදුමයක්

නෙමෙයි. බස් එකේ සීට් ගානට විතරයි යන්නෙ. අපේ අනාගත පරපුර අපි ආරක්ෂා කරගත යුතුයි. කණගාටුයි. ගාල්ල- ඌරල වඳුරඹ වෙනකන් සෙව්වා. අපි අහිංසක දරුවෙකුට කිරි පිටි පැකට් එකක්වත් දෙන්න සලස්වන්න කියලා. වෙළදපලට ගියාම හාල්, පරිප්පු, සීනි නැහැ. අද හේන් ගොවියා අන්ත අසරණයි. සමස්ත රට වැසියන් අසරණයි. අසරණ වූ ජනතාව වෙනුවෙන් සභාපතිතුමාගේ මම ඉල්ලනවා අර සතොස අසළ විෂබීජහරණයවත් කරන්න මාපලගම වහලා. යටලමත්ත උනන්විටිය මේ සියලු ප්‍රදේශ විෂබීජ හරණයට ලක්කරන්න. මරණ සංඛ්‍යාව කියන්නවත්, ආණ්ඩුව විවේචනය කරන්නවත් නෙවෙයි අපි මෙතනට එන්නේ. අහිංසක ජීවිත ටික බේරගන්න. ඒ පිළිබඳවත් මතක් කරනවා.

ඒ වගේම ලැබුණු තොරතුරක් මත නන්දන මන්ත්‍රීතුමාත්, මමත්, අපේ තරංග මන්ත්‍රිතුමත්, උඩුගම ප්‍රදේශයේ උපකාරයාලයට ගියා. එදා මුරකරු මහත්මයා ඔහු එසේම රාජකාරි වෙලාවට වාර්තා කරලා තිබුණා. මේ මොහොත වන විට ඇඟිලි සලකුණු යන්ත්‍රය තිබුණේ පොලිතීන් එකක ඔතලා, ලාච්චුවට දාලා ලොක් කරල තියෙන්නෙ. මේ සම්බන්ධව සභා වාර්තා කිහිපයකම මම කතා කරපුවා ඇති. මේ ඇඟිලි සලකුණු යන්ත්‍රය තියන්න දෙන්නෙම නැහැ. මේක කඩනවා. ඇඟිලි සලකුණු යන්ත්‍රය තිබ්බොත් වෙලාවට හරියට එන්න යන්න ඕන නිසා, ඒක කඩනවා. මේ වගේ අනිත් තැන්වලත් ඇඟිලි සලකුණු යන්ත්‍ර කැඩෙනවද කියලා මම ඇහුවා. මාපලගම උප කාර්යාලය සලකුණු යන්ත්‍රය අද වෙනකම් කැඩිලා නැහැ. ප්‍රධාන කාර්යාලයේ මැෂින් එක කැඩිලත් නැහැ. නමුත් උඩුගම ඇඟිලි සලකුණු යන්ත්‍රය අලුත්වැඩියා කරලා තියනවා නැවත ඒක කඩනවා. කඩපු හැටිත් කියන්නම්. මේ සෙන්ටයිසර් එකට වඩා සැර කෙමිකල් එකක් තියෙනවා. ඒක ඇල්ලුවම දින දෙකයි, තුනයි මලකඩ කාලා, කඩාගෙන වැටෙනවා. එම ප්‍රදේශයට වෙනම රාජකාරි ක්‍රමයක්. ඒ වගේම වෙනම පාලනයක් වෙන්න බැහැ. මොකද ඔබතුමා සභාපති හැටියට තමුන්නාන්සෙ හරි තීන්දු තීරණ ගන්න. මුළු සභාවටම, උප කාර්යාල දෙකයි, ප්‍රධාන කාර්යාලයත් එකයි. තුනටම එක තීන්දුවක් තිබිය යුතුයි. අහිංසක නිලධාරීන් මෙතන ඇවිත් වැඩ කරනවා. ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් ටික වැඩ කරල අපෙන් විවේචනත් අහනවා. නමුත් වැඩ කරලා විවේචන අහන්නේ, මෙන්න මේ තවත් සේවක පිරිසකගේ අසාධාරණය, නොහැකියාව නිසා. වැඩ කරන තමුන්නාන්සේලා වුණත් අපෙන් දෝෂාරෝපණ අහනවා. මැෂින් කඩල තමන්ට ඕන විදිහට පොත්පත් අත්සන් කරන යන්න බැහැ. උප කාර්යාලයේ තත්ත්වය බැලුවා. කනගාටුදායක තත්ත්වයක් තියෙන්නේ. ඒ නිසා ආයතන ප්‍රධානියා හැටියට සභාපතිවරයාකටයුතු කරන්න. උඩුගම උප කාර්යාල ගොඩනැගිල්ල කෝටි ගානක් වියදම් කරලා හදලා තියෙන්නේ. ටිකෙන් ටික කඩාගෙන වැටෙනවා. අද ඒ ගොඩනැගිල්ලේ සීට් ටික ටික කඩාගෙන වැටෙනවා. මේවා සුන්බුන් අතරට යවන්න එපා. තව ටික දවසකින් මීරිසවැටිය බවට පත් වෙයි. ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වන්න කියලා කියනවා. අපි හවස 6.30 ට පමණ ඇප්තොප් එකට ගියේ. වෙනත් ගමනක් ගිහිල්ලා තොරතුරු සොයා ගන්න. ඒ වැඩ කරපු ආකාරය පිළිබඳව සියලු තොරතුරු අපි ලග තියෙනවා. නිලධාරි දකින්න, නිලධාරී යන්නේ නැහැ. යම් යම් පුද්ගලයන්ට ඕන විදිහට වව්චරය අරගෙන ආවම වව්චරය අත්සන් කරන්න තමයි සමහර නිලධාරීන් ඉන්නෙ. මම මේ කියන්නේ සියල්ලෝම ගැන නෙවෙයි. ඇතැම් නිලධාරීන් ගැන පමණයි. අපට ක්ෂණිකව ලැබුණු ඔත්තුවකට අනුව අපි ඇප්තොප් එකට ගියා. ඇතුළු වෙනකොටම කඳක් පැටෙව්වාලු. පැටෙව්ව කඳ අපටත් හොයාගන්න බැරි වුණා. අපි වටපිට බැලුවා. 8.20 වන විටත් මුරකරුවෙක් නැහැ. මෙතන ඇවිල්ල කිව්වම කියනවා. හයහමාරට ආවා කියලා කිවුවා. ඒ නිසා ඒ පිළිබඳව සාධාරණ තීන්දුවක් එන සභාවාරය වනවිට අපි බලාපොරොත්තු වෙනවා. නිලධාරී ලයිට් දාලා යනවා ආයෙ එන්නෙ උදේට. ඕෆ් කරලා යන්නෙත් වැඩ කරන්න එන නිලධාරීන් වෙන්න පුළුවන්. කොස් ගස් පිටින් ගිලපු, ඇට්ටෝනියා ගස් පිටින් ගිලපු සභාවක තමයි අපි මේ ඉන්නේ. නමුත් අපි දන්නවා නමුත් අපි දාපු තැන දන්නවා. සියලු තොරතුරු දන්නවා. දහස් ගණන් වටින කොස් ගස් ගිලපු ඒව ගැන කතා කරන්නේ නැහැ. මේ කරුණු කෙරේ මීට වඩා සැලකිල්ලක් දක්වන්න. අපි මේ කතා කරන හැම

දෙයක්ම යහපත් මඟ යන්නත්, අහිංසක නිලධාරී බේරගන්නත් තමයි මේ කතා කරන්නේ. ඒ නිසා චෙක්පතක් අත්සන් කරන විටත් වවුචරයක් අත්සන් කරන විටත් සැලකිල්ලක් දක්වන්න. මේක අම්බලමක් නෙවෙයි. වගකීමක් ඇතුව අත්සන් කරන්න ඕන. මේ කියන එක හිතේ තියා ගන්නවා නම් හොඳයි. මීට වඩා මම කතා කරන්න යන්නෙ නැහැ. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී එන්.වී.පතිනායක මහතා**

ගරු සභාපතිතුමාගෙන් අවසරයි. ඇත්තටම අපේ සහබන්දු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ පරිදි ඌරල ප්‍රදේශයේ කොවිඩ් වසංගතය හේතුවෙන් වයස අවුරුදු 66 ක පමණ තැනැත්තියක් මියයන්න යෙදුනා. රෝහලෙන් තමයි මෙම වෛරසය බෝ වුණා කියලා ආරංචි වුනේ. ඌරල 222 ඒ ග්‍රාම නිලධාරීතුමා සහ මමත් එම ස්ථානයට ගියා. මුලින්ම එම මෘතශ දේහය බාර ගන්නවත් කිසි කෙනෙක් ඉදිරිපත් වෙලා තිබුණේ නැහැ. ඥාති දියණියක් තමයි දේහය බාර ගන්න ඉදිරිපත් වෙලා තියෙන්නේ. කරාපිටිය රෝහලටවත් යන්න කෙනෙක් හිටියේ නැහැ. අවසානයේ මම රෝහල කරා ගියා. ඇත්තටම දැනුවත් කළාම පොඩි මුදලක් මදි වෙලා තිබිලා ගරු සභාපතිතුමා දැනුවත් කලාම එම මුදල දීමට කටයුතු කළා. එම දැක්වූ සහයෝගය මම කෘතවේදීව සිහිපත් කරනවා. එම කොට්ඨාශය තුල රෝගීන් තිහක් පමණ දැනට ඉන්නවා. අවාසනාවන්ත මරණයක් තමයි සිදුවුනේ. මොකද එතුමියට කාත් කවුරුවත් නැති වයසක යුවලකගේ එක්කෙනෙක් තමයි නැතිවුනේ. බෞද්ධ මධ්‍යස්ථානයක මහත්මයෙක් මරණ කටයුතු සම්බන්ධයෙන් මුදල් ලබාදීම පිළිබඳව මම මේ අවස්ථාවේදී එතුමන්ටත් ස්තූතිවන්ත වෙනවා. එම මාර්ගයේ කොටසක් තණකොළ කපා සුද්ද කරලා තියෙනවා. ඉතුරු දුරත් සුද්ද කරලා දෙන්න කියලා මම මේ වෙලාවේ ඉල්ලීමක් කරනවා. මම මීට වඩා කාලය ගන්නේ නැහැ. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි කොහොමවුනත් මේ වෙලාවේ මට විශේෂ ඉල්ලීමක් කරන්න තියෙනවා. උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ යා කරන මාර්ගයේ පහුගිය වකවානුව තුළදී ඇද හැලුණු ධාරානිපාත වර්ෂාව නිසා කොන්ක්‍රීට් කරපු පාරක බෝක්කුවක් ගලවගෙන ගිහිල්ලා තිබුණා. මම ඊයෙ තාක්ෂණ නිලධාරී මහතා එක් කරගෙන ගිහිල්ලා ඒ තත්ත්වය පෙන්නුවා. ඒක ප්‍රතිසංස්කරණය නොකලොත් ඇත්තටම ප්‍රථමයෙන්, අලුතෙන් කොන්ක්‍රීට් කරපු මාර්ගයක් නිසා විශාල පාඩුවක් සිදුවෙනවා. ලොකු වතුර පාරක් කන්ද හරහා ගලාගෙන යනවා. මේ වෙලාවේ රට ආගාධයට පත්වෙලා තියෙනවා. ඒක අපි සියලු දෙනාම අවිවාදයෙන් පිළි ගන්නවා. කවුරු ආන්ඩු කලත්, අනුන් මත යැපෙන රටක් හැටියට හඳුන්වන්න පුළුවන්. මේ රට 1972 නිදහස ලැබුණට පස්සෙ මේ රටේ පාලන කාලයන් තුල සිදු කරපු දේවල් අපගේ ඉදිරි පරපුරට භුක්ති විඳින්න සිදු වෙලා තියෙනවා. අනෙක් කාරණය තමයි අපි මොන තරම් පිටරටින් යැපුන ද කියන එක. යම් බඩු ප්‍රමාණයක් පිටරටින් ගෙන්න ගන්න බැරි වුනොත් මොන තත්ත්වයක් අපට උදා වෙනවද කියලා මෙම කොරෝනා වෛරසය ව්‍යාප්ත වෙමින් යන මේ අවස්ථාවේ අපට සිතෙනවා. ඒ නිසා මේක දේශපාලන කෝණයකින් මේ වෙලාවේ බලනවනං ඒක අපේ රටේ අවාසනාව ලෙස අපි දකින්නේ. පැහැදිලිව මම දකිනවා මේ වකවානුව තුළදී මේ වෛරසය වළක්වා ගැනීම වෙනුවට, රටේ මාධ්‍ය පිළිබඳව මේ වෙලාවේ සඳහන් කරන්න ඕන. මේ රටේ මාධ්‍ය කොච්චර ප්‍රබලව තිබුනත්, ආණ්ඩුවට වඩා රට පාලනය කරන්නේ මාධ්‍ය. රෝග වළක්වා ගැනීමට දැනුවත් කරනවාට වඩා උද්ඝෝෂණ තමයි මාධ්‍ය හරහා පෙන්වන්නෙ. ජාතිය වැනසීමට ලක්වෙලා. දේශීය කර්මාන්ත, දේශීය ව්‍යාපාර පසුබෑමකට ලක් වෙලා ඒ නිසා තමයි පිටරටවලින් මෙම නිෂ්පාදන ගෙන්වන්නට වෙලා තියෙන්නෙ. විදේශ සංචිත ඉතුරු කරගන්න බැරි වෙලා තියෙන නිසා තමයි බැරෑරුම් තත්වයකට මුහුණ දීලා තියෙන්නේ. ඉදිරියට මීටත් වඩා මේ තත්ත්වය වැඩි වෙන්න පුළුවන්. සියලු දෙනාම එකා

වගේ හිතලා, කටයුතු කරලා මේ තත්ත්වයට මුහුණ දෙන්න ඕන. එහෙම නොවුණොත් මේක ජයගන්න ලැබෙන්නේ නැහැ. සමහර තැන්වල බඩු මල්ල ලැබිලා නැතිව, මිනිස්සු ඉතා අසරණ වෙලා ඉන්නවා. මම එදා මැදිහත්වීමක් කරලා, මගේ වැලිවිටිය කොට්ඨාශය තුළ දවස් තුනකට වඩා බඩු මල්ල ලැබීම පරක්කු වෙලා නැහැ. මොකද මම ප්‍රාදේශීය ලේකම් කායීලයට ඇවිල්ලා ඒ පිළිබඳව සොයා බලා අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියා යන තුරුම පස්සෙන් ඉඳලා සොයා බැලුවා.

ප්‍රාදේශීය සභාව දිහා බැලුවම, ප්‍රාදේශීය සභාවේ අපි යෝජනාවක් දැම්මම, අදාල අංශයට ගිහිල්ලා, අපි පාරක් පිළිබඳව මැනුම් කටයුතු සිදු කරලා දැම්මම, අපි ඇවිල්ලා මේ කටයුතු සිදු කරන තුරු ඉන්නවා. ඒ නිසා ඒ අදාල කායීයන් ඉටු වුණාට පස්සේ, අද දවසේ සභාවෙන් කෙරෙන්න ඕන වැඩ ටික හෙට දවස තුළ දී ඒ අදාළ අංශ තුළට බාර දීලා, විධිමත් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා ගරු සභාපතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා. ඒ නිසා දැන් අපි දාපු යෝජනාවක ඇස්තමේන්තුව මේ සභාවට දාගන්න බැරි වුණා. ඊළඟ කටයුත්ත සිදුකරන්න ලබන සභාව වෙනකම් ඉන්න ඕන. අපි යෝජනාවක් විදිහට දැම්මොත් ඉදිරිපත් කරන්නේ මේ පාරක, ගමක ගමන් කරන්න බැරි මාර්ගයක් සම්බන්ධවයි. ඒ කාර්යය හරියට සිදු වෙන්නේ නැහැ කියලා මම කියනවා. මෙම කාර්යය හරියට කරන්න නම් මේ සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් වෙන්න ඕන. ඒකට හැම වෙලාවෙම මේ සභාවේ කටයුතු ක්‍රියාත්මක කරන්න මේ නිලධාරීන් බැඳී සිටිනවා. එනිසා ඔවුන්ගේ යුතුකම් වගකීම් මනාව ඉටු කරන්න ඕන කියලා මේ වෙලාවේ මම සිහිපත් කරනවා. හැමදේම සිදුවෙනවා නම්, ඒක ගැටළුවක් නැහැ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරින් තුන්දෙනයි ඉන්නේ. ඒ තුන්දෙනාට සංවර්ධන කාර්යයන් වලදී හැම තැනම ගිහින් ඉන්න බැහ. ඒක අපි පිළිගන්නවා. නමුත් ඒ සඳහා විධිමත් අධීක්ෂණයක් කරන්න ඕන. මේ මොනව අනුමත කරල දුන්නත්, සාධාරණ විදියට ක්‍රියාත්මක කරන්න මේකෙ ඉන්න නිලධාරීන් තමයි බැදිලා ඉන්නෙ. ඒ නිසා අපි යෝජනා කරනවා අදාල නිලධාරීන් නිවැරැදි මාර්ගයක ගමන් කරවන්න ඕන කියලා. ඒ නිසා ගරු සභාපතිතුමනි ඒ සම්බන්ධව විශේෂ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිමින්, ඒ වගේම කොරෝනා වසංගතය වගේම ඩෙංගු වසංගතය හිස ඔසවමින් තිබෙන මේ අවස්ථාවේ, ස්වේච්ඡා සංවිධානවල සහාය ලබාගෙන, එය මර්දනය කිරීමට වැඩපිළිවෙළක් සකස් කරන්න කියලා ඉල්ලා සිටිමින්, සියලු දෙනාට සුබ දවසක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඩ වෙනවා.

### ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. මම කතා කරන්න බලාපොරොත්තු නොවුණත්, මේ වෙලාවේ මගේ අදහස් ප්‍රකාශ කරන්න ඕන. පහුගිය දවස්වල වැඩිම කොරෝනා රෝගීන් පිරිසක් වාර්තා වුණේ මගේ ගම් ප්‍රදේශයේ. මෙතන උඩුගම ප්‍රදේශයෙහි මන්ත්‍රීවරුන් ඉන්නවා. අවාසනාවකට අපේ ගමේ හිටපු ලෙඩ්ඩු උඩුගම ප්‍රදේශයට දෙතුන් වතාවක් බෙහෙත් ගන්න ගියාම, බයවෙන්න එපා කොරෝනා නෙවෙයි. මම සහතිකයක් වුණත් දෙන්නම් කියපු දොස්තර මහත්වරු හිටියා. දොස්තර මහත්වරු මිනිස්සුන්ව දැනුවත් කරලා, රෝහල්වලට යවලා PCR කරන්න උනන්දු කළා නම්, මෙතරම් විනාශයක් ගමට සිදු නොවෙන්න තිබුනා. මාධ්‍යය මඟින් රෝග ලක්ෂණ පිළිබඳ මෙපමණ දැනුවත් කරද්දිත්, දැන් අර දොස්තරවරු ඒ පිළිබඳව දක්වන නොසැලකිල්ල හිතාගන්න පුළුවන්. ඒ වගේම අපේ ගමේ මෙපමණ රෝගීන් ප්‍රමාණයක් වැඩි වෙද්දී, වසම් ටිකටම එක මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීතුමයි හිටියේ. වලකුඹුරේ සිට පරණතානායම්ගොඩ දක්වා එක මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීතුමයි ඉන්නේ. එතුමාත් බයිසිකලෙන් වැටිලා, රෝගාතුර වෙලා හිටියේ. එතුමා දැනුවත් කරලා, උපක්‍රමයක් වශයෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක විදිහට ඒ රෝගීන් සිටින නිවෙස් වලට කතා කරලා, මේ ගෙදර උණ

තියෙන අය ඉන්නව නේද? ඒ අය ගිහිල්ලා අනිවාර්යෙන් PCR පරීක්ෂණයක් කරගෙන එන්න ඕන කියලා දැනුවත් කිරීම් සිදු කළා. පළමුව උඩුගම රෝහලට හය දෙනෙක් යැව්වා. ඒ අයගෙන් තුන්දෙනෙක් positive වුණා. ඊට පස්සේ මගේ ළඟ වැඩකරන සේවකයෝ තුන්දෙනෙක් යැව්වා. ඒ අයගෙන් දෙදෙනෙක් positive වුණා. මගේ ළඟ වැඩකරන සේවකයින් positive වෙනකොට ඒකෙන් බේරෙන්න අපට වගකීමක් තියෙනවා. මගේ ගෙදර රියදුරා රෝගයට ගොදුරු වෙද්දී, මම බේරුනේ, මම වෙනමම පොඩි ගෙයක තියලා තමයි එයාලට කෑම බීම දුන්නේ. ඊට පස්සේ වෛද්‍ය අංශයෙන් උපදෙස් අරගෙන අනිත් මිනිසුන් PCR කරන්න යොමු කළා. එතනදී විසි තුන් දෙනෙක් positive වුණා. ගමෙන් විසිතුනක් positive වෙනවා කියන්නේ ලොකු අවදානමක්. සෞඛ්‍ය අංශ ඉතා ඉක්මනින් ඇවිල්ලා, ඒ රෝගීන් රෝහල් ගත කරන්න අවශ්‍ය වටපිටාවත් හදලා, ඒ අවස්ථාවේ යවන්න ස්ථාන නැති වුණා. අම්පාර වගේ දුෂ්කර පළාත්වලට තමයි ඒ රෝගීන් යවන්න කටයුතු කළේ. ඒ වගේම අපේ ගමේ වෛද්‍ය උපදෙස්, ආහාරපාන ඒ සියලු දේ කිසිම අඩුපාඩුවක් නැතුව, බඩුමලු 100කට වඩා බෙදලා තියෙනවා. යම් දෙයක හොඳ පැත්තක් තියෙනවනම්, හොඳ පැත්තත් කියන්න ඕන. අඩුපාඩුවක් තියෙනවා නම්, ඒකත් පෙන්නලා දෙන්නත් ඕන. මේ රජය විසින් ලබා දෙන බඩු මල්ල දරාගැනීමට රජයට හැකියාව තිබෙනවාද මන්දා. මොකද, එක රෝගියෙක් සිටින නිවෙස්වලටත් මේ රුපියල් දහ දහසක බඩු මල්ල ලබා දෙනවා. මගේ ගමේ පවුල් 100 කට පමණ මෙම බඩු මල්ල ලබාදීලා තියෙනවා. ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා වගේ, බඩු මල්ල ලැබෙන්න දින තුන හතරකට වඩා පරක්කු වෙන්නෙ නැහැ. බඩු මල්ල ලබා දෙන්න මගේ වාහනය ලබා දීලා, මම පස්සෙන් ගිහිල්ලා, ඒ මිනිස්සුන්ට අවශ්‍ය දේවල් මම කළා. අවශ්‍ය කරන දේ දම්වැලක පුරුක් මෙන් එකකට එකක් සම්බන්ධ වෙලා සිදුකළා. සභාපතිතුමා සහ අවන්ත මහත්මයා ප්‍රචාරණ කටයුතු වලින් උදව් කළා. ඒ වගේම ගරු මන්ත්‍රීවරුන් අවශ්‍ය දේවල් මොනාද කියල සොයා බැලුවා. මේ වෙලාවේ මම ඒ සියලු දෙනා සිහිපත් කරනවා. ඒ වගේම සම්පත් අතුකෝරල මැතිතුමා සහ නාගොඩ පොලිස් ස්ථානාධිපති, ප්‍රාදේශීය ලේකම්තුමා අවශ්‍ය කටයුතු සිදුකළා. පොලිස් බැරියර් දෙකක් දාලා සංචරණ සීමා ඇති කළා. මොකද නීතියක් නැතිව කිසිකෙනෙකුට යන්න එපා කියන්න බැහැ. නමුත් පොලිසියෙන් ඉන්නකොට ජනතාව ගමන් කරන එක අඩු කළා.

මම මේ අවස්ථාවේ සිහිපත් කරන්න ඕන. අපට මේ වසංගතයෙන් ආරක්ෂා වීමේ වගකීමක් තියෙනවා. චන්දිමා මන්ත්‍රීතුමියගේ නිවසේ තිබූ මංගල උත්සවයට සහභාගි වීමට බැරි වීම සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කරනවා. මේ රෝගයෙන් බේරෙන්න අපේ කටයුතු අපිම කළමනාකරණය කරගන්න ඕන. ගරු සභාපතිතුමනි, මම මේ ගරු සභාවේ යෝජනාවක් දාලා, මාස හයකට වැඩියි. ලක්ෂ දෙකේ වැඩසටහනට ප්‍රතිපාදන ලබාදීම සම්බන්ධව. එකේ වැඩ කිසිවක් ඉවර කරන්න නොහැකි වුණා. ලිපි ගොනු ටික හදලා වැඩ කඩිනම් කරලා දෙන්න. එම ලිපිගොනුවල තියෙන අඩු පාඩු නිසා මෙම ව්‍යාපෘති වැඩසටහන ආපස්සට ගිහිල්ලා තියෙනවා. සහබන්දු මැතිතුමා කියනවා සංවර්ධන කටයුතු සිදු වෙන්නේ නැහැ කියලා. අපි ඊයෙ දිනයෙදිත් ලක්ෂ 20 වැඩසටහන ක්‍රියාත්මක කළා. ඒ අවශ්‍ය නිලධාරීන් පාරක් පාරක් ගානේ සියලු මැනුම් කටයුතු කරලා, කොන්ක්‍රීට් පාරවල් හැමතැනම කැඩිල තියෙන්නෙ. හේතුව කොන්ත්‍රාත්කරුවන් විසින්, මේ රජය විසින්, වෙනත් ක්‍රමවේද වලට කොන්ක්‍රීට් දාන්න යොමු කරපු නිසා. ඉදිරියේදී සංශෝධන වලට ඇවිල්ලා අපේ ගම් වල තියෙන දුෂ්කර පාරවල් සංවර්ධනය කරන්න, මේ යන වැඩපිළිවෙළට සියලු නිලධාරින්ට හා අපේ ජනාධිපතිතුමාට සුභාශිංශනය පිරිනමමින්, නැවත වරක් අප ප්‍රදේශයට කොවිඩ් වසංගතය පැමිණියොත්, ඔබතුමාලගේ සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිමින්, සියලු දෙනාටම ස්තුති වන්ත වෙමින්, මම නිහඬ වෙනවා. සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය**

ගරු සභාපතිතුමනි, මමත් විනාඩියක් ඉල්ලනවා මොකද ලක්රුවන් මන්ත්‍රීතුමා කතා කරද්දි, එක කාරණයක් ගැන කියවුණේ නැහැ. එනම් උඩවැලිවිටිතලාව තැපැල් කාර්යාලය අසල මාර්ගයේ

බෝක්කුවක් තියෙනවා. එතන පාරත් කැඩිලා. කම්කරුවන් දෙන්නෙක් දාලා දෙපැත්තෙ කාණු සුද්ද කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද එතන යම් අවදානමක් තිබෙන නිසා. ඒ වගේ ම කොරෝනා තත්ත්වය ගැන කතා කරනවානම්, අපේ ගමේ මේ වන විට මවක් සහ දුවෙක් කොරෝනා රෝගයට ගොදුරුවෙලා, මධ්‍යස්ථාන වලට ගෙනිහින් තියෙනවා. ඔවුන්ගේ ආශ්‍රිතයන් නිරෝධායනය නොකළ නිසා, පාරේ තැනින් තැන, කඩවල් ගානේ, ඇවිදින විට ග්‍රාම නිලධාරීතුමිය දුරකථනයෙන් ඇමතුමක් දීලා, ඇවිදින්න යන්න එපා. නිවෙස්වලට වෙලා ඉන්න කියලා, කියලා තිබුණා. ඒ කිව්ව වගේ, ඔවුන් නිවෙස් වලට වෙලා සිටිනවා. මම පාර සම්බන්ධයෙන් තමයි කතා කරන්න ආවෙ. වැඩි විස්තර කතාකරන්නේ නැහැ. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සභාවෙන් අවසරයි. ඇත්තටම මම මේ නැගී සිටියේ යටලමත්ත නැගෙනහිර විලකොළදෙනිය පාර සම්බන්ධව, අපේ පහුගිය රජයෙන් පාර කොන්ක්‍රීට් කරලා තියෙනවා. කොන්ක්‍රීට් කරලා නවත්වපු තැන විශේෂයෙන් සෝදා පාළු වෙලා. ඒ නිසා එම ස්ථානයෙන් බයිසිකලයකින් යන මනුස්සයෙක් වැටුනොත්, ඇත්තටම ජීවිත හානියක් වුණත් සිදු වෙන්න පුළුවන්. මන්ද අපේ නන්දන මන්ත්‍රීතුමා දන්නවා. ගම්වාසීන් අපි මේ ගැන කතා කරන්නෙ නැහැ කියලා දෝෂාරෝපණය කරනවා කියලා. ඇත්තටම මෙම ස්ථානය යම්කිසි විදියකින් පිළිසකර කර දෙන්න. මොකද එම ස්ථානය දරුණුම අවධානම් ස්ථානයක්. ඒ අවශ්‍ය කටයුතු කරලා දෙන්න කියලා ඉල්ලා සිටිමින්, ඒ වගේම නිරෝධායන බඩු මල්ල ගැන ගැන කිසි දෝෂාරෝපණයක් කරන්නේ නැහැ. මොකද යටලමත්තට නිසි වෙලාවට බඩු මල්ල ලැබුණා. ඒකටත් ස්තූති කරමින්, පහුගිය දවසෙ කොරෝනා වැක්සින් එක අපේ ග්‍රාම නිලධාරී වසම් තුනටම ලබා දුන්නා. ඒ නිසා උඩුගම සෞඛ්‍ය නිලධාරි මහතා සහ අපගේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාටත් ස්තූති කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා**

පැමිණ සිටින සියලු දෙනාගෙන් සහ ගරු සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, කිහිපවිටක්ම මම මතක් කලා. උඩුගම යම් හොරකමක් කරලා, ඒකෙ පැමිණිල්ලක් දැම්මා. ඒත් ඒක විභාග වුණේ නැහැ. ගරු සභාපතිතුමනි, පැමිණිල්ල දාල තියෙන්නෙ තුන්වෙනි මාසයේ විසි පස්වෙනිදා. මම පැමිණිල්ලක් දාලා ඒක විභාග වුණේ නැති නිසා මම බොරු පැමිණිල්ලක් දැම්මා වෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අනුදැනුම ඇතිව තමයි මම ඒ පැමිණිල්ල දැම්මෙ. ඒක නිසා මම දන්නෙ නැහැ ගරු සභාපතිතුමනි, ඒ ගැන හොයන්නේ නැත්තේ මොකද කියලා. ඔබතුමා මේ සභා වාරයේදී, ඊට ඉස්සෙල්ල සභා වාරයේදී වගේ මේක මාසෙන් මාසෙට පස්සට යවන්න එපා. ඔබතුමාගෙන් කෙරෙන්න තියෙන යුතුකම් කොටස මේ වෙලාවේ ඉෂ්ට කරන්න. එවිට ඔබතුමාට අපි ගෞරවය පුද කරනවා. නමුත් මේ වගේ දේවල් උනාම මේක ටිකක් බොරු පැමිණිල්ලක් වෙනවා. ඔබතුමා මට කිව්වා. සමන් පැමිණිල්ල දාන්න. මම බලන්නම් කියලා. අද මං හිතන්නේ, හොරකම් කරපු යකඩ කැලි ටික කුඩු කරලා, හදලා, ගෙවල් වලට දාලත් ඇති. ඒ නිසා සභාපතිතුමනි, ඒ සම්බන්ධව කටයුතු කරන්න. ඒ වගේම හෝමදොල පාර ඔබතුමා බලන්න ගියා. සම්බන්ධීකරණ කමිටු කිහිපයකදී මම කතා කළා. මෙතන මනුස්සයෙක් මැරිලා ගියොතින්, ඒකෙ වගකීම කවුරුත් ගන්නෙ නැහැ. ඒක නිසා මම තාක්ෂණ නිලධාරි මහතාගෙන් ඉල්ලීමකුත් කලා. ඉතා ඉක්මනින් මේකට ඇස්තමේන්තුව හදලා, සභාවට දාන්න කියලා. නමුත් ගරු සභාපතිතුමනි, මේ සභාවාරයටවත් එම ඇස්තමේන්තුව දාලා නැහැ. රාජකාරි බහුල නිසා දාන්න බැරි වෙන්න ඇති. ඔබතුමාගෙන් මං ඉල්ලීමක් කරනවා එම ස්ථානය හදලා දෙන්න කියලා. ඒක අවදානම් සභා පාරක්. එතනදි අපි ඉල්ලීම් කළාම, ඔබතුමා කිව්වා. මේක සභා පාරක්. ආර්.ඩී. එකට සම්බන්ධ නැහැ කියලා. දැන් ඒ කෙරෙන්නෙත් නැහැ. ආර්.ඩී එකෙන් කරන්නෙත් නැහැ. ඒක නිසා ඉතා ඉක්මනින් මෙතනට

ක්‍රමවේදයක් හදලා දෙන්න. ඒ වගේම මම ප්‍රකාශ කල හොරකම සම්බන්ධයෙන් පොලිසියත් එක්ක කතා කරලා, මේ පැමිණිල්ල විභාග කරලා, එතනට ගිහිල්ලා බලන්න. මේක යටගහන්න දෙන්න එපා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,**

ඔබතුමාගේ පැමිණිල්ලට මොකද වුනේ කියලා පොලිසියෙන් අහන්න.

**ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා**

යකඩ ගත්ත කඩේට ගිහිල්ලා කටඋත්තර ගත්තා. මොකද මන්දා මේකෙ යට ගැහෙන්නේ. ඔබතුමාට බලය තියෙනවා. මට පැමිණිල්ල දාන්න කිව්වා නම්, ඒකට ඇක්ෂන් එකක් ගන්න. සභාපතිතුමා පැමිණිල්ල දාන්න කියලා ඕඅයිසී මහත්තයට කතා කතා කරන්නෙත් නැහැ. ගරු සභාව වෙනුවෙන්, මේක මම මුලින්ම දාපු පැමිණිල්ලක්. කරුණාකරලා සභාපතිතුමනි, මේක විභාග කරලා මාව නිදහස් කරලා දෙන්න. මේ සභාවට දාලා ඇක්ෂන් එකක් නොගත්තොත්, මම fb දාලා හරි මොකක් හරි කරනවා. මම සභාවට දාලත් මේ සම්බන්ධව කිසි දෙයක් කරන්නේ නැහැ. ඒ වගේම මා සඳහන් කළ පාර ගැනත් අවධානය යොමු කරන්න. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා**

ගරු සභාපතිතුමනි, සභාවෙන් අවසරයි. මම මේ අවස්ථාවෙ කතා කරන්නෙ නැතුව ඉන්න හදලත්, කතා නොකර බැරි වුණා. මම අද සභාවට එනවිට බලාපොරොත්තුවෙන් ආව දේ නෙවෙයි මෙතන සිද්ධ වෙන්නේ. වටපිටාව සම්බන්ධයෙන්. පහුගිය දිනවල අපි මන්ත්‍රීවරු එක්ක කතා කරන විට, අපි මේ සභාවට එන්නේ කොහොමද? එනවද? නැද්ද? මොකක්ද? ඒ වගේ පුද්ගලිකව අපි කාගෙ කාගෙත් හිතේ තිබුණේ වෙනත් අදහසක්. ඒ වගේම මේ වගේ වෙලාවක අපට ඒකරාශී වී කටයුතු කරන්න පුලුවන්ද? මොකද ගිය සභාවෙ, ඔබතුමාට ආණ්ඩුකාරතුමා කියලා තියෙනවා. සභාව කෙටියෙන් තියන්න කියලා. ඔබතුමා ඒක ඒ ආකාරයෙන්ම ඉටුකළා. අද වන විට එම තත්ත්වය ඉතා යහපත් තත්ත්වයකට හැරිලා කියලා මම විශ්වාස කරනවා. ගරු සභාපතිතුමනි, උඩුගම රෝහලේ ඇන්ටිජන් පරීක්ෂණ දිනපතාම උදේ 10 සිට සවස දෙක දක්වා සිදු කරනවා. එහිදී අපේ පළාතේ නෙළුව තවලම දක්වා සැක සහිත අය උඩුගම රෝහලට එනවා. ඇවිල්ලා සමහර වෙලාවට ඇන්ටිජන් පරීක්ෂණයක් කළාට පස්සෙ, positive වුනොත්, ඒ එන වාහනෙත් එහෙමම දාළා රෝහල්ගත වෙන්න සිදුවෙනවා. සමහර වෙලාවට අම්පාරෙන් තමයි එළියට එන්නේ. ගරු සභාපතිතුමනි, දැන් මේ අවස්ථාව වනවිට යම් වටිනාකමක් දීලා අවශ්‍යම දේ තමයි කරන්නෙ. මේ අවස්ථාවේ ආදාහනාගාරය මගින් හොඳ ආදායමක් සභාවට ගන්න පුළුවන් අවස්ථාවක් මේක. මේක විහිළුවට ගන්න ඕන අවස්ථාවක් නෙවෙයි.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා උඩුගම රෝහලට දිනපතා තුන් හාරසීයක් පිට පළාත්වලින් එනවා. දවසට 20 30 ක් positive වෙනවා. ඒ positive වුනහම, ඒ අයට පහසුකම් තියන අය යනවා. එනවා. නමුත් අනෙක් අය ගාල්ලට හා දුර පළාත්වලට යවන නිසා අපි මේ වසංගතයක් තියෙන අවස්ථාවේදී මන්ත්‍රීවරු කතා කරන්නේ තාමත් අර පාරේ වැඩේ මට නැහැ කියලා. ලබන සභාව වන විටදී මේ ඉන්න 27 දෙනාම එකට ඉන්නවද කියන්නත් බැහැ. ඒ වගේ දැඩි අවධානමක් තියෙන කාලෙක සමහර මන්ත්‍රීවරු ගැන පුදුමයි. සමහර දේවල් ඉල්ලුම් කරන ඒක සාධාරණයි. අසාධාරණ නෙවෙයි. නමුත් මේ වෙලාවේ දී මුල්තැන දෙන්න ඕන ඒකට නෙවෙයි. දීලා තියෙන කොහේ හරි කොරිපස් ටිකක් දාලා, j.c.b. එකේ වැඩක් කරලා, එකේ බිල දාලා. මම දන්නෙ නැහැ කීයක් හරි සාක්කුවට එනවද නැද්ද කියලා. නමුත් මේ වෙලාවේ මුල් තැන දෙන්න ඕන

සභාපතිතුමනි, අපේ මේ ප්‍රදේශය කොරෝනා අවදානමෙන් මුදවා ගැනීම සඳහා මොනවද කරන්න අවශ්‍ය කියන ඒක සම්බන්යෙන්. මේ සභාවේදී ඒ ගැන ධර්මසිරි මන්ත්‍රීතුමා කතා කළා. එතුමා යම් යම් වැඩපිළිවෙලවල් කරලා යම්තාක් දුරට දෙයක් කරලා තියෙනවා. එතුමා නොකියපු කොටසක් තියෙනවා. එදා විසි තුන් දෙනෙකු positive වෙච්ච වෙලාවේ මැදගම ප්‍රදේශයේ සහ කෝරලේගම වගේ ප්‍රදේශවල ඒ සියලුම දෙනා අපේ ප්‍රාදේශීය සභා මහජන ක්‍රීඩාංගනයට එකතු වෙන්න උපදෙස් දීලා තිබුණා. ඒ රෝගීන් ඒ 23 24 එක්කම 60 ක් 70 විතර මිනිස්සු එකතු කළා. නමුත් සභාපතිතුමනි, බස් රථය ආවේ නැහැ. අර ඔක්කොම රෝගීන් ටික අපේ හෝමදොල මහජන පිට්ටනියෙ ගේට්ටුවෙන් ඇතුලෙ. ඒ මිනිස්සුන්ට ඇල් වතුර එකක් වත් නැහැ. ඉස්සරහ මාළු විකුණනවා ජානක කියලා, එයත්, පොළේ බඩු විකුණන දෙන්නෙක් එකතු වෙලා සල්ලි එකතු කරලා තමයි ඒ අයට බීම බෝතල් කිහිපයක් ගෙනත් දුන්නේ. නමුත් අපේ ප්‍රාදේශීය සභාව ලක්ෂ ගණන්, කෝටි ගණන් වැඩ කතා කරනවා. ඇස්තමේන්තු කරනවා. ප්‍රදේශයේ මහජනතාවට තමයි හැමදේම කරන්නේ. පාරවල් හදන්නේ. සභාපතිතුමනි අපි ඒවායින් පොඩ්ඩක් ඈත්වෙලා, මේ සභාවේ මුදලින් අපේ මේ කොරෝනා රෝගීන් ආරක්ෂා කරන්න පුළුවන් වැඩපිළිවෙළක් සකස් කරමු. විශේෂයෙන් උඩුගම රෝහලට අවශ්‍ය කරන පහසුකම් මොනවද බලලා, මේ වෙලාවෙදි අපි ඒ දේ දෙමු. මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්මයාගෙන් මොනවහරි ඉල්ලුවම, ඒ මනුස්සයා මාරු වෙනවා. විශේෂයෙන් උඩුගම රෝහල ගැන මේ දවස්වල සොයා බලන්න. උඩුගම රෝහලේ ප්‍රධාන ආහාර වේල් තුන පමණයි දෙන්නේ. මම පුද්ගලිකවත් ගිහිල්ලා තේ වේල් කිහිපයක් ලබා දුන්නා. අපේ ප්‍රදේශයට තිබෙන මූලික රෝහල තමයි උඩුගම රෝහල. එම ස්ථානයට මේ කොරෝනා රෝගය පාලනය කරන්න අවශ්‍ය සහයෝගය උපරිම ලෙස මේ ඉදිරි දින කිහිපයේදී ලබා දෙන්න. මාපලගම හාඩ්වෙයාර් එකක පුද්ගලයන් විස්සක් විතර positive වෙලා. සමහරු මග ඇරලා ඉන්නවා කියලා ආරංචියි. ඒ ගැන සොයා බලා ඒ ප්‍රදේශයට තිබෙන අවදානම නැති කරන්න කටයුතුකරමු. අපි අනෙක් කාරණා වලින් බැහැර වෙලා, අපේ ප්‍රදේශය ආරක්ෂා කර ගැනීමේ වැඩපිළිවෙළක් කරන්න කියලා ඉල්ලමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ධනංජය විලේගේ මහතා**

ගරු සභාපතිතුමා, තරංග මන්ත්‍රීතුමා බොහොම වැදගත් කරුණු ටිකක් කිව්වා. ඔබතුමාටත් කතා කළා. උඩුගම රෝහලට PCR කරගන්න එන මිනිස්සුන්ට රැඳිල ඉන්න ස්ථානයක් නැහැ. සභාපතිතුමනි, ඒකට තාවකාලික හට් එකක් වගේ එකක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා අදහස් දක්වමින්**

මන්ත්‍රීතුමා, ඒක ලබාදුන්නා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උපසභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගෙන්,මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. අද ගරු මන්ත්‍රීවරුන් කතා කරන්නේ ඇත්තටම කොවිඩ් වසංගතය මර්දනය කිරීම පිළිබඳව. මේක ලොකු වසංගත තත්වයක්. මම මුලින්ම මතක් කරන්න ඕන. එක් ගමකින් එක් ලෙඩෙක් අහුවුනාම, මුළු

ගමම බිය වද්දපු කාලයක් තිබුණු බව. අද වන විට මීට වඩා වෙනස් ලෙස මේ දිහා බලනවා. මේ වසංගත තත්ත්වය වර්ධනය වුනෙත් අපේම වරදින් තමයි. මේකට අපි සියලු දෙනාම වගකිව යුතුයි. උගත් බුද්ධිමතුන් පවා අද වන විට පාරට බැහැලා පෙළපාලි යනවා. නමුත් එතුමන්ලා තමයි අපේ ගුරුවරු. අපට හොඳ නරක කියා දුන් අය. කොහොම නමුත් එම ඉල්ලීම් සාධාරණ වෙන්න ඇති. නමුත් අවස්ථානුකූලව බැලුවම මේ අවස්ථාවේ එහෙම දේවල් කරන්න හොඳ නැහැ. ඉතින් මේ දේවල් කාට කියන්නද? අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිදුන්ගේ දූරදර්ශී ක්‍රියාකලාපය නිසා තමයි මේ හැම දෙයක්ම සිදුවන්නේ. එතුමාගේ බලාපොරොත්තුව වූයේ අපේ රට වංචාවෙන්, දූෂණයෙන් තොර සෞභාග්‍යමත් දියුණු රටක් බවට පත් කරන්න. එම බලාපොරොත්තුව ඉටු කරගැනීම තමයි අපි කාගෙත් බලාපොරොත්තුව වෙලා තිබුණේ. නමුත් මේ කොවිඩ් වසංගත තත්ත්වය මත ඒ බලාපොරොත්තුව යම්තාක් දුරකට මගහැරෙනවා. මෙවැනි වසංගත තත්වයක් නාවනම්, එතුමන්ගේ දූරදර්ශී වැඩ පිළිවෙල ගැන ඔබතුමන්ලාට පිළිගන්න වෙනවා. මේ උද්ඝෝෂණය කරන අය හිතන්න ඕන. අපි සියලු දෙනාටම බලපාන පොදු ප්‍රශ්න සහිත කාල වකවානුවක් බව. අපේ මන්ත්‍රීවරු ප්‍රකාශ කලා වගේ, මේ කාලයේදී විය යුත්තේ පවතින තත්ත්වයන් යටතේ, සෞඛ්‍ය නීතිරීති වලට අනුගතව, සභා රැස්වීම පැය භාගයකට සීමා කිරීම වුවත්, (අවශ්‍ය සම්මත කිරීමත් අවසන් කර ගෙන) අද සභා කාලය ඔබතුමන්ලා දීර්ඝ කර ගත්තා. මොකද ඔබතුමන්ලාට කතා කරන්න අවස්ථාව නොදුන්නොත්, එයත් ප්‍රශ්නයක්. ඔබතුමන්ලාම තමයි මෙහි නියෝග කරන්නේ. තවත් මන්ත්‍රීතුමෙක් කිව්වා. අවශ්‍ය දේ කතා කළේ නැහැ කියලා. ඇත්ත. අපි මේ වකවානුවට අදාළ දේ සම්බන්ධවයි කතා කළ යුත්තේ. ගරු මන්ත්‍රීතුමන්ලා, යම්තාක් දුරට හෝ අපි මේ කොවිඩ් මර්ධන කටයුත්තේදී, සියලු දෙනාම සාමූහිකව එකතුවී, කටයුතු කළ යුතු බව මම ඉහළින්ම අගයනවා. මොකද මේ කාලයට අනුව විය යුත්තේ එයයි. කොවිඩ් මර්දන කටයුත්තේදී, අපි අපේ කොට්ඨාශයේ පුළුවන් විදියට සියලු ප්‍රදේශයක්ම විෂබීජහරණය සිදුකළා. මේ කටයුත්ත වෙන ප්‍රදේශවල ප්‍රාදේශීය සභාවලින් 100%ක්ම සිදුවුණා කියලා මම හිතන්නේ නැහැ. දැන් මේ විසබීජ හරණ කටයුත්ත අත් හැරලා නෙවෙයි. මෙය කරගන්න බැහැ. අපටත් අපේ ප්‍රාදේශීය සභාවේ මේ කටයුත්ත සඳහා සේවකයෝ දෙන්නයි තුන්දෙනයි ඉන්නේ. මේ මිනිස්සු මගින් මේ බල ප්‍රදේශයේ එතරම් වැඩ කොටසක් කරන්න බැහැ. පහුගිය දවස්වල මම ශ්‍රම බලකායෙනුත් ශ්‍රමිකයන් ගෙන්නගෙන, මෙම කටයුත්තේදී උපරිම සහයෝගය දැක්වූවා. විශේෂයෙන්ම කොරෝනා වසංගත තත්ත්වය තුළ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එන්නත්කරණ කටයුත්තේදී අපේ සභාවෙන් තමයි වැඩිපුරම ශ්‍රම දායකත්වයක් සහ වියදමක් කරන්නේ. කෙසේ වෙතත්, අපි ඒ වියදම දරනවා. අපේ පෙර පාසල් ගුරුවරුන් පවා දින තුනක් හතරක්ම එන්නත්කරණ කටයුත්තේදී එන්නත් කරන මධ්‍යස්ථානවලට යොදවලා තිබුණා. ඊට අමතරව, අපේ සේවකයන් විසබීජහරණ කටයුතු සිදු කරනවා. ඊට අමතරව බඩුමලු බෙදාහරින කටයුත්තේදී, අපේ සභාව මුල් තැනක් ගෙන කටයුතු කරනවා. නිරෝධානයට ලක් වෙලා, බඩුමලු නොලැබුණු අයට, කෙලින්ම දිසාපතිතුමාට කතා කරලා, එතුමන්ව දැනුවත් කර, එම බඩුමලු ලබාදීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස මම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලනවා. ඒ හැම දේකටම මෙම සභාවෙන් අවසර දීලා තියෙනවා. ඊට අමතරව ජනතාව නිරන්තරයෙන් දැනුවත් කිරීම සඳහා, ප්‍රචාරණ රථය යොදවලා තියෙනවා. ඉතින් ඊට වඩා යමක් අපට කර ගැනීමට අපහසුයි. ප්‍රාදේශීය සභාව ලෙස අපි කොවිඩ් මර්දන ක්‍රියාවලියේදී දක්වන සහයෝගය අනෙක් සභා වලිනුත් කෙරෙනවද කියලා ඔබතුමන්ලා සොයා බලන්න. ඇත්තටම මන්ත්‍රීවරුනි, මෙම කොවිඩ් මර්ධන කටයුත්තේදී දොස්තර මහත්වරු, මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු, දිසාපතිතුමා වගේම මහජනතාව කතා කරන්නෙත් අපට. මේ වන විට අපේ සභා බල ප්‍රදේශය තුල 60% ක් 70% විතරම එන්නත්කරණයට භාජනය කරලා තියෙනවා. ඊට අමතරව වයස අවුරුදු 60 ට වැඩි පිරිස සියල්ලටම වගේ එන්නත්කරනය සිදුකර අවසන් වෙමිනුයි යන්නේ. මේ හැම දෙයක්ම කරන්නේ අපි ආරක්ෂා වෙන්න. ඒ වගේම අපේ මන්ත්‍රීතුමන්ලා මළ ගෙවල්, මගුල් ගෙවල්වල යනවා. මේ හැම දෙයක්ම කරන්න ඕන අපි ආරක්ෂා වෙලා. විශේෂයෙන්ම මේ

වන විට මේ ප්‍රදේශයේ කොරෝනාවලින් බේරුණු එකම ආයතනය විදියට අපේ ප්‍රාදේශීය සභාව තමයි ඉතිරිවෙලා තියෙන්නෙ. එම නිසා ආශ්‍රිතයන්ට පවා අපි ඒම වළක්වලා, යම්තාක් දුරට හෝ සභාව කොවිඩ්වලින් ආරක්ෂා කර ගත්තා. ඒ ආරක්ෂිත බව රැකගනිමින්, සභාවෙන් ඉටු විය යුතු රාජකාරි නොපිරිහෙළා ඉටු කළා. එක් අවස්ථාවක උඩුගම රෝහලේ රෝහල් අධිකාරිතුමා දුරකථනයෙන් කතා කරලා, ඇන්ටිජන් කිරීම සඳහා අතරමැදි රෝහලක් හදන්න හට් එකක් ඉල්ලා සිටියා. එම අවස්ථාවේ මම වැයිහේන අධිකාරි වානක මහත්මයට කතා කරලා, එතුමාගෙන් මඩුවක් ලබාගෙන, රෝහලට ලබාදීමට කටයුතු කළා. ඒ වගේම වෛද්‍ය අධිකාරිතුමා විසින් ඇන්ටිජන් කිරීම සඳහා පැමිණෙන පුද්ගලයන්ට තේ පැන් සංග්‍රහයක් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන්න පුළුවන්ද කියලා ඒකට උත්තරයක් දෙන්න බැරි වුණා. ඇප්තොප්වත්ත සම්බන්ධයෙන් මේ සභාවේ කතා වුනා. අඩුපාඩුවක් වෙන්න ඇති. අපි ඔබතුමාලත් සමග කමිටු පත් කරලා, ඉදිරි කටයුතු සිදු කරමු. ඒ වගේම මට උවමනාව තියෙන්නේ ඇප්තොප්වත්ත ආරක්ෂා කර ගැනීම සහ සංවර්ධනය කර ගැනීමයි. මීට අමතරව ආදාහනාගාරය ඉදි කිරීම සහ වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා මුල්ගල් තැබීමේ උත්සවය ඉදිරි දිනයන්හිදී පැවැත්වීමට අපි හිතාගෙන ඉන්නවා. රටේ පවතින තත්වයන්ට අනුකූලව ඒ කටයුතු සියල්ලට ඔබතුමන්ලාගේ සහයෝගය, දායකත්වය අපේක්ෂා කරමින් රටේ පවතින වසංගත තත්ත්වයෙන් ඔබතුමන්ලාගේ ගෙවල් වල සිටින සියලුම දෙනා ආරක්ෂා කර ගැනීමට, ඔබතුමන්ලාට හැකියාව, ධෛර්යය, වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කරමින් ඔබ සියලු දෙනාටම තෙරුවන් සරන ප්‍රාර්ථනා කරමින්, සභාවේ කටයුතු අවසන් කරනු ලබනවා. ඔබ සැමට ස්තූතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                                                  දිනය:-